# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2293/72 – 2022 අගෝස්තු මස 20 වැනි සෙනසුරාදා – 2022.08.20**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2018/175.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

අංක 2281/21 දරන හා 2022.05.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් බදුල්ල, කුට්ටියගොල්ල, නාගොල්ල, නිල්මිණි නිවස හි පදිංචි ඩබ්. ඒ. විජේදාස මහතා සහ අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 77/2021 දරන හා 2022.04.01 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 77/2021 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මකවීම 2023.05.25 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අගෝස්තු මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 37291 – 18 (2022/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවෙකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

2022.07.19

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටයි.

2022.05.25 දිනැති අංක 2281/21 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, ඩබ්. ඒ. විජේදාස සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය බැඳී සිටින්නාවූ ද 2022.04.01 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

නීතිඥ රුචිරානි ජයකොඩි.
ප්‍රධාන නීති නිලධාරී,
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුල පාර,
කොළඹ 05.

*පිටපත* -
ඩබ්. ඒ. විජේදාස, නිල්මිණි නිවස, නාගොල්ල, කුට්ටියගොල්ල, බදුල්ල.

EOG 08-0189

---

මගේ අංකය: IR/COM/02/2019/02.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

අංක 2270/69 දරන හා 2022.03.11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් දෙහිවල, පල්ලිදොර පාර, අංක 31, 1/1 හි පදිංචි ඩී. පී. එන්. කේ. ජනරංජන පීරිස් මයා සහ අනෙක් පාර්ශවය වශයෙන් බත්තරමුල්ල, වික්‍රමසිංහපුර හි පිහිටි සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 103/2009 දරන හා 2022.02.11 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ඩී. පී. එන්. කේ. ජනරංජන පීරිස් මයා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 103/2009 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මකවීම 2023.03.11 දින සිට අවසන්වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අගෝස්තු මස 01 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**'අ' ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවෙකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : ඩී. පී. එන්. කේ. ජනරංජන පීරිස්,
අංක. 06, රජයේ නිවාස සංකීර්ණය,
ගල් විහාර පාර,
නැදිමාල,
දෙහිවල.

දිනය : 2022.06.27

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2022.03.11 දිනැති අංක 2270/69 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද, ඩී. පී. එන්. කේ. ජනරංජන පීරිස් සහ ස්වාධීන රූපවාහිනි සේවය බැඳී සිටින්නාවූ ද 2022.02.11 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන* -

*පිටපත* - (අනෙක් පාර්ශවය)
සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය,
වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

---

(1) ප්‍රතික්ෂේප කරන පාර්ශවය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශවයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න.)

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශවයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශවයක්, සේවායෝජකයෙකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 08-0190

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.